ශීර්ෂය 111 -සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය
------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1.1 විගණන විෂය පථය
----------------------

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, ඇවර කිරීමේ ගිණුම් හා සැසැදුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 සැප්තැම්බර් 29 දින අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම
----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම , ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 117,162 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 112,122 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම රු.මිලියන 5,040 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.3 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | සියයට |
| පුනරාවර්තන | 91,000 | 90,494 | 506 | 0.56 |
| මූලධන | 26,162 | 21,628 | 4,534 | 17.33 |
| එකතුව | 117,162 | 112,122 | 5,040 | 4.30 |

2.2 ආදායම් ගිණුම

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.03.07.01 සඳහා එකතුව රු.මිලියන 170 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 168.7 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 99 ක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | සියයට |
| 1003.07.01 | 170.00 | 168.72 | 1.28 | 0.75 |

2.3 අත්තිකාරම් ගිණුම
---------------------
රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම
---------------------------------------------
පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්
--------------------------------------------------
අමාත්‍යාංශයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11101 | 920.00 | 757.15 | 653.00 | 653.35 | 1,919.00 | 1,398.47 |

2.4 අග්‍රිම ගිණුම
-------------
අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 293 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7002/000/00/0100/0014/000 | 211.77 |
| 7003/000/00/0014/0014/000 | 82.37 |
| **එකතුව** | **294.14** |

2.5 පොදු තැන්පත් ගිණුම
-------------------------
අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් තුනක ශේෂ එකතුව රු.මිලියන 519 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0024/000 | 473.68 |
| 6000/0000/00/0002/0027/000 | 34.48 |
| 6000/0000/00/0001/0026/000 | 11.48 |
| එකතුව | 519 |

2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

3. ශීර්ෂය 111- සෞඛ්‍ය අමාත්‍යාංශය

3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් 2015 මාර්තු 31 දින වනවිට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, ආදායම් සංකේතය 10.03.07.01 දරන ආදායම් ගිණුම මාස 3 ½ කට වැඩි කාල පමාවකින් පසුව විගණනයට ඉදිරිපත් කර තිබුණි. පහත සඳහන් ගිණුම් 2015 නොවැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය | ගිණුමේ නම | ප්‍රමාදය |
|---|---|---|
| | | වර්ෂ |
| 34003 | අංගොඩ මානසික රෝහලේ වෘත්තිය ප්‍රතිකාර අත්තිකාරම් කාර්යයේ ගනුදෙනු බේරා වසා දැමීමේ අත්තිකාරම් ගිණුම. | 08 |
| 34004 | අංගොඩ සහ මුල්ලේරියාව මානසික රෝහල්වල නේවාසික රෝගීන්ගේ ප්‍රයෝජන සඳහා වන බේකරි අත්තිකාරම් කාර්යයේ ගනුදෙනු බේරා වසා දැමීමේ අත්තිකාරම් ගිණුම. | 08 |

3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

| | | |
|---|---|---|
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඈ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |
| (ඊ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (උ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය |

3.3 විගණන සාක්ෂි නොවීම

---------------------------

ගෙවීම් වවුචර්, කළ වැඩ බිල්පත්‍ර, ඉන්වොයිස්, භාණ්ඩ ලැබීම් තුණ්ඩු, භාණ්ඩ භාරගත් බවට සහතික හා ගෙවීම් සහතික, ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයේ නොතිබීම නිසා එකතුව රු.6,673,828,085 ක මුදලකට අදාළ වූ කොන්ත්‍රාත් ගනුදෙනු 03ක් පිළිබඳව හා ප්‍රසම්පාදන කමිටුවලට සහභාගිවුවන්ගේ නම් ලැයිස්තු, ලංසු කැඳවීම් ලිපි, ප්‍රසම්පාදන කමිටු වාර්තා, බිල්පත්‍ර සහ ගෙවීම් සහතික යනාදිය නොමැතිවීම නිසා යාපනය ශික්ෂණ රෝහලේ එකතුව රු.2,479,727 ක ගනුදෙනු 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

3.4 විගණන විමසුම්වලට පිළිතුරුදීම

------------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 37 කටද ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 05 කටද 2015 මාර්තු 31 දින වන විට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.13,121,687,195 ක් විය.

3.5 විසර්ජන ගිණුම

------------------

3.5.1 අයවැය විචලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 37 ක් සඳහා සළසා තිබුණු රු.1,584,363,074 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූලධන වැය විෂයයන් 65 ක් සඳහා සළසා තිබූ රු.2,658,751,362 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 51 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි

3.6 අග්‍රිම ගිණුම්
-------------

2014 දෙසැම්බර් 31 දිනට **පැවති** අග්‍රිම ශේෂ එකතුවෙන් 2015 අප්‍රේල් 30 දින වන විට මහා භාණ්ඩාගාරයට පියවා නොතිබුණු ශේෂ එකතුව රු.82,009,477 ක් වී තිබුණි.

3.7 පොදු තැන්පත් ගිණුම
------------------------

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් තුනක ශේෂ එකතුව රු.519,642,980 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0001/0026 | 11,477,270 |
| 6000/0000/00/0002/0027 | 34,484,710 |
| 6000/0000/00/0015/0024 | 473,681,000 |
| එකතුව | 519,642,980 |

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුමට අනුව, ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාළ වර්ෂ 2 ක කාලයක් ඉක්මවූ තැන්පතු ශේෂවල මුළු එකතුව රු.118,581,099 ක් විය. එම ශේෂ සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. රජයේ ආදායමට ගත යුතු තැන්පතු වටිනාකම හා තව දුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගත යුතු තැන්පතු වටිනාකම වෙන්කර හඳුනා ගැනීමට හැකි වන පරිදි තැන්පත් ලේඛන යාවත්කාලින කර නොතිබුණි.

(ආ) යාපනය ශික්ෂණ රෝහලේ 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.7,784,357 ක්වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(1)ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයකම අවසානයේදි පිළියෙල කළ යුතු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2012 හා 2013 වර්ෂවලදී කෑගල්ල ශික්ෂණ රෝහල සඳහා අමු ආහාර සැපයූ කොන්ත්‍රාත්කරුගේ එකතු කළ අගය මත බදු සඳහා වූ ලියාපදිංචිය අවලංගුවී තිබීම නිසා එම කාල පරිච්ඡේදය තුළ ඔහු වෙත ගෙවා තිබුණු රු.1,016,888 ක එකතු කළ අගය මත වූ බදු මුදල සම්පූර්ණයෙන් අයකරගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. 2015 ජනවාරි 13 දින වන විටත් එසේ ලබා ගෙන තිබුණු බදු මුදල නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.

3.8 ආදායම් ගිණුම්
-----------------

විගණනයට ඉදිරිපත් කර තිබුණු ආදායම් සංකේතය 10.03.07.01 දරන ඖෂධ, උපකරණ, විලවුන් හා ඖෂධ වෙළඳසැල් ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම් ගිණුමේ, 2014 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම රු.4,318,000 ක්වූ අතර එය 2011 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

3.9 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය
---------------------------------------------------------------------

විෂය අංක 11101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.182,058,407 ක්වූ අතර ඉන් රු.69,605,822 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුනු ශේෂ විය. හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර ණය අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

3.10 ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්
-------------------------------------

2004 සැප්තැම්බර් 22 දිනැති අංක අ.ම.ප. 04/1121/008/036 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අත්තිකාරම් ගිණුම් විෂය අංක 34003 හා 34004 හි ඇවර කිරීමේ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. එම ඇවර කිරීමේ කටයුතු 2006 නොවැම්බර් 30 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. එහෙත් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 08 ක් ගතවී තිබුණද, එම ඇවර කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.

**3.11 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය**

**3.11.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරි සැලැස්ම මාස හයක ප්‍රමාදයකින් පසුව 2014 ජුනි 09 දින පිළියෙල කර තිබුණි.

**3.11.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

පහතින් විස්තර දැක්වෙන කරුණු අනුව ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් පිළියෙල කර තිබුණු 2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම විධිමත් පරිදි ලෙස පිළියෙල කර නොතිබුණිමේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,681,280,000 ක්වූ උපකරණ වර්ග 71 කින් ඒකක 3,059 ක් මිලදී ගැනීමට සැලැසුම්කර තිබුණද, 2014 සැප්තැම්බර් මාසය වන විටත් ඉන් කිසිදු උපකරණයක් මිලදී ගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු රු.123,009,838 ක් පිරිවැය වූ උපකරණ වර්ග 09 කින් ඒකක 436 ක් සමාලෝචිත වර්ෂවලදී මිලදී ගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේදී මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණු උපකරණවලට සළසා තිබුණු රු.655,478,906 ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් 2011, 2012, හා 2013 වර්ෂවලදී මිලදී ගැනීමට සැලැසුම් කර තිබුණු උපකරණ වර්ග 36 ක් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණි.

**3.11.3 විගණන හා කළමනාකරණ කමිටුව**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය යටත් පිරිසෙන් අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03ක් පමණක් පවත්වා තිබුණි.

## 3.12 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සතු වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත විස්තර සඳහන් සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | වත්කමේ අයිතිය සතු ආයතනය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| ගොඩනැගිලි (මාලිගාවත්ත වකුගඩු ඒකකයේ මුළුතැන්ගෙය) | ජාතික රෝහල | 01 | වසරකට වැඩි |
| මෝටර් වාහන | සෞඛ්‍ය අමාත්‍යාංශය | 09 | වසරකට වැඩි |
| යන්ත්‍ර සූත්‍ර | යාපනය ශික්ෂණ රෝහල | 01 | වසර 05කට වැඩි |
| යන්ත්‍ර උපකරණ හා ලී බඩු | යාපනය ශික්ෂණ රෝහල | 1,700 | වසර 01 සිට 07 දක්වා |
| වෛද්‍ය උපකරණ | කාසල් වීදියේ කාන්තා රෝහල | 24 | වසරකට වැඩි |
| පරිගණක මෘදුකාංග | පවුල් සෞඛ්‍ය ඒකකය, වකුගඩු ඒකකය හා නුවරඑළිය, කල්මුනේ, යාපනය, කන්තලේ, අක්කරෙයිපත්තුව, පේරාදෙනිය යන රෝහල් | 08 | වසර 01 සිට 03 දක්වා |

(ii) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ඖෂධ ගබඩාව සඳහා ඉදිකර තිබුණු ගොඩනැගිල්ල වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබීම හේතුවෙන්, විගණන දිනය වූ 2015 පෙබරවාරි 10 වන විට ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය වර්ග 03 කින් ඒකක 56,000 ක් පිළිකා ඒකකයේ ගබඩා කර තිබුණු අතර ඖෂධ අඩංගු පෙට්ටි තැනින් තැන අනාරක්ෂිතව තබා තිබුණි. ඖෂධ වර්ගවල පිරිවිතරවලට අනුව බොහෝ ඖෂධ නියමිත උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා කරමින් ඒවායේ ගුණාත්මකභාවය ආරක්ෂා කළ යුතු බව පසුගිය විගණන වාර්තා මඟින් පෙන්වාදී තිබුණද, ඒ පිළිබඳව සළකා බලා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාශයෙන් සළසා තිබුණු රු.562,000 ක ප්‍රතිපාදනවලින් කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහලේ තත්ත්ව කළමනාකරණ ඒකකය සඳහා මිලදී ගෙන තිබුණු රු.307,000 ක් වටිනා තාක්ෂණ උපකරණ හා ලී බඩු ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

(iv) ශල්‍යාගාරවල ප්‍රයෝජනය සඳහා සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුවේදී අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු රු.4,475,235 ක් වටිනා උපකරණද, රෝහලේ ඉල්ලීමකින් තොරව 2014 ජුලි 16 දින උපාංග නොමැතිව සපයා තිබුණු රු.390,000 ක් පිරිවැය වූ Oxygen Concentrator 02 ක්ද, වාට්ටුවලට ප්‍රමාණවත් තරම් CTG Machine පැවතියද, 2014 මැයි 21 දින සපයා තිබුණු රු.197,000 ක් වටිනා CTG Machine එකක්ද කුලියාපිටිය රෝහල තුළ වසරකට ආසන්න කාලයක් උපයෝජනය නොකර තබා තිබුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
----------------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර්17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, අමාත්‍යාංශයට අයත් රෝහල් හා ආයතන 65 කින් 36 ක එකී නියමයන්ට අනුව කටයුතු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ආයතන 03ක් 2012, 2013 වර්ෂයන් සඳහා ද භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ සිදුකර තිබුණු වාහන භෞතික සමීක්ෂණයේදී රේඛීය අමාත්‍යාංශය යටතේ වන රෝහල් හා ආයතනවල පවතින වාහන පමණක් සමීක්ෂණයට ලක් කර තිබුණු නමුත් අමාත්‍යාංශය තුළ භාවිතා වන වාහන හෝ

පරිබාහිර ආයතනවලට ලබාදී තිබුණු වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඈ) බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු වත්කම්
-----------------------------------------------------

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණි. විස්තර පහත දැක්වේ.

(i) විධිමත් පරිදි අපහරණය කර නොතිබුණු වාහන 11 ක් වෘත්තීය පුහුණු ආයතන වෙත අබලි වාහන ලෙස මුදාහල බවට ලේඛන ගත කර තිබුණි. අමාත්‍යාංශය නමින් වූ ලියාපංදිංචිය අහෝසි කර නොතිබුණු අතර අදාළ ආයතන වෙත ලැබුණු බවට හෝ භාරගත් බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගිලන් රථ 04 ක් ඇතුළුව වාහන 08 ක පරිහරණ අයිතිය බාහිර ආයතන 08 ක් වෙත අවිධිමත් ලෙස ලබාදී තිබුණි. පරිහරණ අයිතිය පැවරීමට විධිමත් අනුමැතියක් ලබා නොගෙන තවත් ගිලන් රථ 09 ක් බාහිර ආයතන 04 ක් වෙත ලබාදී තිබුණි. එසේ ලබාදී තිබුණු වාහන 17 ක සත්‍ය වශයෙන්ම එම ආයතන වෙත ලැබුණු බවට හෝ භාරගත් බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම
-----------------------------------------------------------------

ලියාපදිංචි හිමිකාරිත්වය අනාවරණය නොවූ හා අමාත්‍යාංශය සතු නොවූ වාහන 49 ක් අමාත්‍යාංශය විසින් පරිහරණය කරමින් පවතින බව තහවුරු විය.

(ඉ) වත්කම් අපහරණය නොකිරීම හා අවිධිමත් ලෙස අපහරණය කිරීම.
-------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාවිතයෙන් තොරව අමාත්‍යාංශයෙන් පිටත විවිධ ස්ථානවල ගාල් කර තිබෙන වාහන 09 විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) උතුරු නැගෙනහිර යුධ සමයේදී අතුරුදහන්වූ බවට පොලිසියට පැමිණිලි කර තිබුණු වාහන 11 ක නීත්‍යානුකූල හිමිකාරීත්වය අමාත්‍යාංශය සතු වන බව අනාවරණය විය. මෙම වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කිරීමට සහ කිසියම් අක්‍රමිකතාවයකට හෝ අකටයුත්තකට

යොදාගත නොහැකි වන අයුරින් ඒවායේ ලියාපදිංචිය අහෝසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) තීරු බදු රහිතව ආනයනය කර තිබුණු බැවින් විකිණීම හෝ පැවරීම සිදුකළ නොහැකි බවට කොන්දේසියක් සහිතව මිලදී ගෙන තිබුණු වාහන 48 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා තිබුණි. වාහන 48 හි නීත්‍යානුකූල හිමිකාරත්වය පවරාදීමට හා විධිමත් අනුමැතියක් සහිතව පොතෙන් අස් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම වාහන 48 විකුණා තිබුණු බව විගණනයේදී අනාවරණයවූ නමුත් ඒවා අස්ථානගත වාහන ලෙස විගණනයට වාර්තා කර තිබුණි.

(ඊ) අස්ථානගතවූ වත්කම්

------------------------

නීත්‍යානුකූල හිමිකාරිත්වය අමාත්‍යාංශය සතු වාහන 752 ක් අමාත්‍යාංශ වාහන ඇණිය තුළ භෞතිකව නොපවතින බව අනාවරණය විය. එම වාහන අපහරණය කර ඇත්ද යන්න හෝ නොඑසේ නම් දැනට පවත්නා ස්ථානය හෝ භාවිතා කරනු ලබන්නේ කුමන පාර්ශවයක් විසින් ද යන්න පිළිබඳව නිශ්චිත තොරතුරු ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් විය.

3.13 බේරුම් නොකළ බැරකම්

-----------------------------

2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් බේරුම් නොකළ බැරකම් රු.6,789,967,480 ක් පවතින බව ගිණුම්වලින් හෙළිදරව් කර තිබුණද, ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණු එදිනට රාජ්‍ය ඖෂධ සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට බේරුම් නොකළ බැරකම් රු. 14,961,757,448 ක් වන බව තහවුරු විය.

3.14 අනුකූල නොවීම්

------------------

(අ) නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| (i) වෳවස්ථාපිත විධිවිධාන | | |
| • 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනත | - | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකළ වාහන 15 කට වැඩි ප්‍රමාණයක් අමාත්‍යාංශය විසින් ධාවනයේ යොදවා තිබුණි. |
| • 1980 අංක 27 දරන විලවුන්, උපකරණ හා ඖෂධ පනත | 23,470,500 | සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ඖෂධ හා වෛද්‍ය උපකරණ, විලවුන්, උපකරණ හා ඖෂධ අධිකාරිය තුළ ලියාපදිංචි කර ආනයන බලපත්‍රයක් ලබා ගත යුතුවේ. නමුත් Resuscilator Baby උපකරණය සඳහා ආනයන බලපත්‍රය ලබා නොගත් සැපයුම්කරුවෙකුගෙන් එම උපකරණ 15 ක් ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් මිලදී ගෙන තිබුණි. තවද වෛද්‍ය උපකරණ ලියාපදිංචි සහතිකය හා ආනයන බලපත්‍රය ලබා නොගත් සැපයුම් කරුවන්ගෙන් C-Arm - X ray යන්ත්‍රයක් සහ Pediatric Fiber Optic Nasolaringoscope නැමති යන්ත්‍ර දෙකක් රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් මිලදී ගෙන තිබුණි. |
| • 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ 02(1) උප වගන්තිය | 69,114,993 | කොන්ත්‍රාත් ගිවිසුම සමාගම් රෙජිස්ටාර් ජෙනරල් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබා ගත යුතු නමුත් ජීව වෛද්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | ඉංජිනේරු සේවා අංශය විසින් ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත් 05 කට හා රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත් 01 කට අදාළ ගිවිසුම් ලියාපදිංචි කිරීමේ සහතික කොන්ත්‍රාත්කරුගෙන් ලබා ගෙන නොතිබුණි. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | XII වැනි පරිච්ඡේදයේ 23 වන වගන්තිය හා II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 1.4 වගන්තිය හා I වෙනි පරිශිෂ්ඨය | 96,244 | කොළඹ වරායේ පිහිටුවා ඇති සෞඛ්‍ය කාර්යාලයේ සේවයේ නියුතුව සිටින වෛද්‍යවරුන් තිදෙනකු අනුමැතියකින් තොරව විදේශගතවී තිබියදී මෙරට සේවය කළ බවට සාවද්‍ය ලෙස දින පොත් නඩත්තු කර එවැනි විදේශ ගතවීම් අවස්ථා 09 කදී දින 63ක් වෙනුවෙන් වැටුප් ලබාගෙන තිබුණි. |
| (iii) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | • මුදල් රෙගුලාසි 106 (3) | 3,285,475 | අයකර ගත නොහැකි පාඩු හා හානි, පොතෙන් අස්කිරීම සඳහා නියෝග ලබාගෙන තිබුණු නමුත් භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා ගෙන එම පාඩු කපා හැරීමට කටයුතු කර නොතිබුණි. |
| | • මුදල් රෙගුලාසි 109 | 206,932,423 | සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ හෙළිදරව් කර තිබුණු, 2002 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට කටයුතු කළ යුතු පාඩු හා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | අලාභහානි හැරිමට කටයුතු කර නොතිබුණි. |
| | | c. | මු.රෙ. 156 (1) | 824,450 | නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ තිබී නැතිවී තිබුණු අන්වීක්ෂයේ හා කඳාන දිසා රෝහලේ තිබී අලුත් වැඩියාවක් සඳහා භාරදී ආපසු ලබා ගෙන නොතිබුණු බෙහෙත් ගණින යන්ත්‍රයේ වටිනාකම් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට විධිමත් පරිදි කටයුතු නොකර පොතෙන් කපා හැරීමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. |
| i. | ii. | iii. | 2007 අප්‍රේල් 5 දිනැති අංක 33 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය -------------------------- | | |
| b. | | c. | 2.1.2 ඡේදය | | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වු ගෝලීය අරමුදල් ව්‍යාපෘතියට නිලධාරින් 349 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |
| | | d. | 4.3.2 ඡේදය | 967,797 | ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහාවූ ගෝලීය අරමුදල් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට |

| | | | |
|---|---|---|---|
| | | | ද්විතීයික පදනම මත බඳවා ගෙන තිබුණු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවන රාජ්‍ය සේවයේ නිලධාරින් 16 දෙනෙකු වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවීම් කර තිබුණි. |
| iv. v. vi. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ<br>------------------------<br>a. 2014 පෙබරවාරි 12 දිනැති අංක එස්ජ්/01/2012 දරන චක්‍රලේඛයේ 23 වන වගන්තිය | 932,217 | ටෙන්ඩර් කැඳවා තරඟකාරී මිළ ගණන් යටතේ ඉටුකර ගතයුතු අලුත්වැඩියා කොන්ත්‍රාත් රු.200,000 සීමාව තුළ කොටස් කර ඉටු නොකළ යුතු වුවද, රිජ්වේ ආර්යා ළමා රෝහලේ වාට්ටු අංක 01 හා හෙද නේවාසිකාගාරය අළුත්වැඩියා කිරීම ඉහත සීමාව තුළට ගැනෙන පරිදි කොටස් 09 කට වෙන්කර කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබුණි. |

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවීම්
------------------------------------------------------------

i. බදුල්ල මහ රෝහලට මෙට්ට 150 ක් මිලදී ගැනීම සඳහා වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර තිබුණු අතර 2014 ජනවාරි 29 දින එකක් රු.2,500 බැගින් මෙට්ට 200 ක් මිලදී ගෙන මුළු මුදල රු.500,000 ක් ගෙවා තිබුණි. 2014 මැයි 30 දින මුල් සැපයුම්කරුගෙන්ම තවත් මෙට්ට 100 ක් මිලදී ගෙන මුළු මුදල රු.250,000 ක් ගෙවා තිබුණි. මෙට්ට 150 ක් සඳහා වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කර තිබුණු බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 වගන්තිය ප්‍රකාරව ඉන්

සියයට 50 ක් වූ මෙට්ට 75 ක් පමණක් නැවත ඇණවුම් කළ හැකි වුවද, ඊට පටහැනිව වැඩිපුර මෙට්ට 75 ක් නැවත ඇණවුම් කර මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා වැයකර තිබුණු මුළු මුදල රු.187,500 ක් විය.

ii. බදුල්ල මහ රෝහලේ සුළු අළුත්වැඩියාවන් සඳහා ලියාපදිංචි කර තිබුණු සැපයුම්කරුවන් අතරින් මිල ගණන් කැඳවීමකින් තොරව තෝරා ගෙන තිබුණු සැපයුම්කරුවෙකු වෙත රු.1,627,558 ක් පිරිවැයවූ අළුත්වැඩියා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

iii. විලවුන්, උපකරණ හා ඖෂධ අධිකාරියේ ඖෂධය ලියාපදිංචි කර නොතිබුණු සැපයුම්කරුවෙකුගෙන්, 2014 ජනවාරි මාසයේදී එකක් රු.713.80 බැගින් මුළු පිරිවැය රු.23,848,058 ක් වූ හා අවශ්‍යතා පිරිවිතරවලට අනුකූල නොවූ Bupivacaine hydrochloride injection 0.5% ඖෂධ ඒකක 33,410 ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන තිබුණි. හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වමින් ඇණවුම නිකුත් කර පැය 48 ක් ඇතුළත සැපයීම සිදුකළ යුතු බවට කොන්දේසියක් ඉදිරිපත් කරමින් දේශීයව මිලදී ගැනීමට කටයුතු කර තිබුණද, දින 14 ත් දින 43 ත් අතර ප්‍රමාද කාලයකින් පසුව අවස්ථා 4 කදී සැපයීම භාර ගෙන තිබුණි. එසේම 2014 පෙබරවාරි මාසයේදී අවශ්‍යතා පිරිවිතර වලින් සමන්විත වූ මෙම ඖෂධ ඒකකයක් රු.402.91කට රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් සපයා තිබුණු බැවින්, දේශීය සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීම තුළ රජයට සිදුවී තිබුණු මුළු අලාභය රු.10,386,835 ක්විය.

iv. සමාලෝචිත වර්ෂයේදී රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් රු.8,865,000ක් වැය කර C-Arm X-ray යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. ලංසු ලියකියවිලිවලට අනුව, යන්ත්‍රයේ පිරිවැය හා වසර10ක නඩත්තු පිරිවැයේ ශුද්ධ වර්තමාන අගය එකතු කර මිල ගණන් ඇගයීම සිදුකළ යුතුව තිබුණු නමුත් යන්ත්‍රයේ පිරිවැය පමණක් ඇගයීමට ලක්කර සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. නිසි පරිදි මිල ගණන් ඇගයීම සිදු නොකිරීමේ හේතුවෙන් වැඩිම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් යන්ත්‍රය මිලදී ගැනීම තුළ රජයට සිදුවී තිබුණු අලාභය රු. 2,216,290 ක් විය. සැපයුම්කරු සමඟ ගිවිසුමක් අත්සන් කරද නොතිබුණි.

v. 2014 මැයි සිට 2015 අප්‍රේල් දක්වාවූ වර්ෂයක කාලයක් සඳහා මාතර මහ රෝහලට අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව රු.31,893,600 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට

පිරිනමා තිබුණද  සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. 2015 මැයි සිට ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් නව සැපයුම්කරුවෙකු තෝරා ගත යුතුව තිබුණු නමුත් ඊට පටහැනිව එම සැපයුම්කරුගෙන්ම  අමු ආහාර මිලදී ගෙන තිබුණි.

3.15 විදේශ ණය හා විදේශාධාර ව්‍යාපෘති

----------------------------------------

සමාලෝචිත වර්ෂයේදී විදේශ මූල්‍යනය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 63 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු. 20,953,135,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන්  රු.9,813,667,606 ක් උපයෝජනය කර තිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට භාජනය නොවූ විදේශණය ව්‍යාපෘති

---------------------------------------------------

හම්බන්තොට හා නුවරඑළිය දිස්ත්‍රික් රෝහල් සංවර්ධනය, උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලන සේවාවන් වැඩි දියුණු කිරීම හා ජාතික රුධිර පාරවිලන සේවය යටතේ පවතින පර්යන්ත ලේ බැංකු ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම යන ව්‍යාපෘති 03ක් සඳහා නෙදර්ලන්ත රජය විසින්  සපයා තිබුණු  විදේශ ණය අරමුදල්වලින් 2013 හා 2014 වර්ෂවලදී වැයකර තිබුණු මුළු මුදල රු.6,349,436,747ක් වුවද ගෙවීම්  වවුචර් හා අදාළ තහවුරු ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණු බැවින් එම ව්‍යාපෘති 3 ට අදාළ ගණුදෙනු විගණනය කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් අරමුදල්  උපයෝජනය කර  නොතිබුණු  ඉදිකිරීම් ව්‍යාපෘති

------------------------------------------------------------------------------------

i. සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමට අපොහොසත් වීම නිසා විදේශාධාර ව්‍යාපෘති 03 කට සලසා තිබුණු රු.85,000,000 ක ප්‍රතිපාදන හා ප්‍රතිපාදන වෙන් කරන අවස්ථාව වන විටත් වැඩ අවසන් කර තිබුණු ඉදිකිරීම් ව්‍යාපෘති  02  ක් සඳහා විදේශාධාර වලින් සලසා තිබුණු රු.23,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි.

ii. අවශ්‍යතා හඳුනා නොගැනීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් නොකිරීම, වැඩ අතරමඟ නතර කර තිබීම,  කොන්ත්‍රාත්කරු පිළිබඳ නෛතික පියවර ගැනීම හා ප්‍රමාණවත් අග්‍රිම මුදල් නොලැබීම වැනි කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විදේශ

අරමුදල් ඉදිකිරීම් ව්‍යාපෘති 10 ක් සඳහා සලසා තිබුණු රු.372,200,000 ක්වූ ප්‍රතිපාදන වලින් රු. 55,715,732 ක් පමණක් උපයොජනය කර තිබුණි. මූල්‍ය ප්‍රගතිය සියයට 15 ක් පමණක් විය.

iii. 2012 සහ 2013 වර්ෂ වලදී රු.1,406,442,706 ක් වැයකර තිබුණු ව්‍යාපෘති 05 කට සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරන ලද රු.460,000,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අත්හැර දැමීම

---

ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2005 වර්ෂයේදී ආරම්භ කර අත්තිවාරම පමණක් ඉදිකිරීමෙන් අනතුරුව ඉදිකිරීම් අතර මග නවතා දමා තිබුණි. කෙසේ වෙතත් එම ඉදිකිරීම්වලට අදාළ ප්‍රතිපාදන ලද ආකාරය, ලද ප්‍රතිපාදන ප්‍රමාණය, මුළු පිරිවැය ඇස්තමේන්තුව, ඉංජිනේරු ඇස්තමේන්තුව, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා අනුගමනය කළ ප්‍රසම්පාදන ක්‍රමය, කොන්ත්‍රාත් වටිනාකම, ගිවිසුම, සැළසුම හා චිත්‍ර සටහන්, කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම් පිළිබඳ විස්තර ආදී වූ කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

වැඩ නැවතී වර්ෂ 06 කට පසු ගෙන තිබුණු 2011 අප්‍රේල් 05 දිනැති අංක 11/0812/504/073 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ජර්මනියේ පුනර් නිර්මාණ බැංකුවෙන් යුරෝ මිලියන 28 ක් හෙවත් ආසන්න වශයෙන් රු.මිලියන 4,300ක ණයක් ලබාගෙන දැනට ඉදිකර ඇති අත්තිවාරම මත ඇඳන් 600ක් හා රෝගීන් 800කට පහසුකම් සැලසිය හැකි බාහිර රෝගී ප්‍රතිකාර අංශයක් සහිතව ඉතිරි ඉදිකිරීම් සිදුකිරීම සඳහා 2012 අගෝස්තු 16 දින අදාළ ණය ගිවිසුම අත්සන් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව 2014 වර්ෂයේදී ඉදිකිරීම් අවසන් කළ යුතු වුවද, කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම අත්සන්කර තිබුණේ 2015 ජූලි 30 දින දීය.

3.16 දේශීය අරමුදල් ව්‍යාපෘති

---

(අ) ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

---

i. සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමට අපොහොසත් වීම නිසා දේශීය අරමුදල් ව්‍යාපෘතියකට සළසා තිබුණු රු.15,000,000 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි

ii. දකුණු කොළඹ ශික්ෂණ රෝහල තුළ මහල් 07 කින් සමන්විත වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා අනුමත මුළු පිරිවැය ඇස්තමේන්තුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණු අතර 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ දේශීය අරමුදල් වලින් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.1,065,030,000 ක් විය. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.398,139,547 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර ගිවිසුම ප්‍රකාරව 2006 සැප්තැම්බර් 15 දින වැඩ ආරම්භ කර 2008 මාර්තු 09 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. මහල් 07 කින් යුත් ගොඩනැගිල්ල මහල් 08 දක්වා වැඩිකිරීමට ඉදිරිපත්වී තිබුණු පරිත්‍යාගශීලියෙකු සමඟ 2008 ඔක්තෝබර් 09 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණයවූ කරුණු පහතින් දැක්වේ.

a. කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 100 ඉක්මවා තිබීම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්කරු තෝරාගත යුතු නමුත් ඊට පටහැනිව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණි.

b. අනුමත කළ යුතු මහල් 07 කින් යුත් ගොඩනැගිල්ල මහල් 08 දක්වා වැඩි කිරීමට අවශ්‍ය අමතර මුදල් සඳහා එක්සත් ජනපද ඩොලර් 700,000 ක් ලබාදීමට ඉදිරිපත්වී තිබුණු පරිත්‍යාගශීලියෙකු සමඟ 2008 ඔක්තෝබර් 09 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු නමුත් ඒ වන විට මහල් 07 ක ගොඩනැගිල්ල සඳහා අත්තිවාරම් ඉදිකර අවසන් කර තිබුණු බැවින් මහල් 08 දක්වා වැඩි කළ හැකිද යන බව උපදේශක ආයතනයෙන් හෝ සුදුසුකම් ලත් ඉංජිනේරුවෙකුගෙන් හෝ සහතිකයක් ලබා ගෙන නොතිබුණි. තවද අමතර මහළ ඉදිකිරීම දක්වා ගොඩනැගිල්ලෙහි සංයුතිය වෙනස්කර ඉදිකිරීම් ආරම්භ කර තිබුණද, ඊට පෙර සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට

හෝ අදාළ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ කොන්ත්‍රාත්කරු සමඟ සංශෝධිත ගිවිසුමකට එළඹීමට හෝ කටයුතු කර නොතිබුණි.

c. වැඩ පැහැර හැරීම හා ගිවිසුම් කොන්දේසි කඩකිරීම හේතුවෙන් 2014 පෙබරවාරි 21 දින කොන්ත්‍රාත්කරුගේ වැඩ නතර කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබුණු උපකරණ මිලදී ගැනීමේ අත්තිකාරම් රු.42,966,690ක් ඇතුළුව ගෙවා තිබුණු රු.122,594,600 ක්වූ අත්තිකාරම් වලින් රු.50,925,439 ක් අයකර ගැනීමට හෝ අත්තිකාරම් ඇප බැදුම්කරය මුදල් කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

d. උපකරණ මිලදී ගැනීමේ අත්තිකාරම් උපයෝජනය කරමින් කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගෙන තිබුණු රු.42,966,690ක් පිරිවැයවූ උපකරණ වර්ෂ දෙකක සිට නිශ්ක්‍රීයව වැඩ බිමෙහි තබා තිබුණු අතර ඒවායේ වගකීම් කාලය පිළිබඳ තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

e. 2010 මාර්තු 16 සිට 2012 දෙසැම්බර් 31 දක්වා වූ වර්ෂ දෙකකට අධික කාලයක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම නවතා තිබුණු බව ලිපි ගොනුවේ සටහන් හා තොරතුරු මගින් තහවුරු වුවද එම කාලය සඳහා උපදේශක ආයතනය වූ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත උපදේශක ගාස්තු ලෙස රු.14,163,819 ක් ගෙවා තිබුණි.

f. 2015 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණු අතර එදින වන විට මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පිළිවෙලින් රු.241,351,256 ක් හා සියයට 65 ක් පමණක් විය.

g. රු.19,906,977 ක් වූ කාර්ය සාධන ඇප බැදුම්කරය 2009 මැයි 31 දින වන විට කල් ඉකුත්වී තිබුණු නමුත් එහි කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණු බැවින් කාර්ය සාධන ඇප බැදුම්කරය මුදල් කර ගැනීමට නොහැකිවී තිබුණි.

3.17 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

--------------------------------------

ගැලපුම් කළයුතු ශේෂ

-------------------------

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| අනු අංකය | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| i. | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 6,610,129 | 260,527 | 6,870,656 |
| ii. | හඳුනා නොගත් බැර | 218,435 | - | 218,435 |

3.18 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මාතර මහ රෝහල විසින් මිලදී ගෙන තිබුණු මුළු පිරිවැය රු.15,944,951 ක්වූ උපකරණ වර්ග 13 කින් මුළු පිරිවැය රු.8,857,123 ක්වූ උපකරණ වර්ග 06 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් රෝහල වෙත ලැබී නොතිබියදී හා පිරිවිතරවලට අනුකූලද යන්න පරීක්ෂාවකින් තොරව සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා ලියා තිබුණු චෙක්පත් 06 ක් විෂය ලිපිකරු අත රඳවාගෙන තිබුණි.

(ආ) ඉන්වොයිස් වටිනාකම රු.3,352,772 ක්වූ Deltacide කෘමි නාශක ලීටර් 395ක් මිලදී ගැනීමේදී, ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සඳහා ලබාදී තිබුණු රු.3,000,000 ක අධිකාරී සීමාව තුළට ගැනෙන ලෙස ඉන්වොයිස් වටිනාකම කොටස් දෙකකට වෙන්කර රු.2,983,547 ක් හා රු.359,225 ක් වශයෙන් චෙක්පත් දෙකකින් මුදල් ගෙවා තිබුණි.

(ඇ) වෙන්දේසියට ඉදිරිපත් නොකර, වෙන්දේසියේදී අලෙවි නොවූ වාහනයක් ලෙස සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින්,වටිනාකම හෙළිදරව් නොකෙරුණු නමුත් අංක 51-7229 දරන

මිට්ෂුබිසි වර්ගයේ කැබ් රථයක් රු.290,000 ක් වැනි අඩු වටිනාකමකට නිලධාරියෙකුට විකුණා තිබුණි.

(ඇ) අපහරණය සඳහා විධිමත් නිර්දේශයක් ලබා ගැනීමෙන් තොරව, වටිනාකම විධිමත් පරිදි තක්සේරු නොකරන ලද හා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම් නොකරන ලද අංක 32-7409 දරන මිට්ෂුබිසි වර්ගයේ ජීප් රථයක් රු.395,000 ක් වැනි අඩු වටිනාකමකට නිලධාරියකුට විකුණා තිබුණි.

3.19 අවිධිමත් ගනුදෙනු
---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විලවුන්, උපකරණ හා ඖෂධ අධිකාරියේ ලියාපදිංචි නොකරන ලද හා ආනයන බලපත්‍රය ලබා නොගෙන පෞද්ගලික ආයතන විසින් ආනයනය කර තිබුණු ඖෂධ නිශ්කාෂණය කිරීම සඳහා ආනයනය පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බව දක්වමින් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ අධිකාරිය විසින් නිකුත් කර තිබුණු ලිපි සංඛ්‍යාව 1,121 ක් විය. මෙම අවස්ථා 1,121 ට අදාළ ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම රජයට අහිමිවී තිබුණි.

(ආ) කෑගල්ල ශික්ෂණ රෝහලට අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් කාලය හා කාර්ය සාධන ඇපකරයෙහි කාලය ඉකුත්වී තිබියදී, රු.2,246,714 ක් වැය කර 2014 මාර්තු 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා මාස දෙකක කාලයකට අවශ්‍ය අමු ආහාර පැරණි කොන්ත්‍රාත්කරුගෙන්ම මිලදී ගෙන තිබුණි.

3.20 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් රාජ්‍ය ඖෂධ සංස්ථාවට හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු මුදල රු.14,961,757,448ක් වන බව ගිණුම්වලින් හෙළිදරව් කර තිබුණද, එය රු. 3,110,986,730 ක් පමණක් වන බව අදාළ සංස්ථා දෙක විසින් තහවුරු කර තිබුණි. ශේෂ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කරමින් රු.11,850,770,718 ක වෙනසට හේතු හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහතින් දැක්වේ.

| ණයහිමියාගේ නම | ගිණුම්වලට අනුව ණයහිමි ශේෂය | ණයහිමියන් විසින් තහවුරු කළ ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | 14,941,074,771 | 3,090,162,053 | 11,850,912,718 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 20,682,677 | 20,824,677 | (142,000) |
| එකතුව | 14,961,757,448 | 3,3110,986,730 | 11,850,770,718 |

3.21 අධිකාරී බලය නොමැතිවූ ගනුදෙනු

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව, සුභසාධක සංගම් හා ආපනශාලා කමිටු විසින් තෝරා ගෙන තිබුණු සැපයුම්කරුවන් 11 ක් වෙත ජාතික රෝහල් පරිශ්‍රය තුළ පිහිටි ආපනශාලා 11 ක් පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

3.22 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විලවුන්, උපකරණ හා ඖෂධ අධිකාරිය විසින් 2014 වර්ෂයට අදාළව නිකුත් කරන වෙළඳසැල් ලියාපදිංචි කිරීමේ බලපත්‍රයක් ලබා නොගෙන හා ලබා ගෙන තිබුණු බලපත්‍ර අලුත් කිරීමකින් තොරව පවත්වා තිබුණු ඖෂධ හා උපකරණ වෙළඳසැල් නියැදියකින් තෝරාගත් වෙළඳසැල් 159 කින් රජයට අහිමිවී තිබුණු ආදායම 1,943,500ක් විය. ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් විසින් මෙම වෙළඳසැල් පරීක්ෂාකර ආදායම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු නමුත් 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී සිදුකර තිබුණු පරීක්ෂණ සංඛ්‍යාව අඩුවී තිබුණි.

(ආ) වෛද්‍ය සැපයුම් අංශය විසින් රාජ්‍ය ඖෂධ සංස්ථාව හරහා විදේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගන්නා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය රෝහල් වෙත බෙදාහැරීමෙන් පසු තත්ත්ව පරීක්ෂාවට යොමු කිරීමේ අවිධිමත් ක්‍රමය හේතුවෙන්, ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය රෝගීන් වෙත නිකුත් කිරීමෙන් පසු තත්ත්ව පරීක්ෂණ වාර්තා ලැබී තිබුණි. එම තත්ත්ව පරීක්ෂණ වාර්තා වලින් තත්ත්වයෙන් බාල බව තහවුරු කර තිබුණු රු.218,623,768 ක් වටිනාකම වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්කරන ලෙස නියෝග කරමින්

සමාලෝචිත වර්ෂය තුළදී වෛද්‍ය සැපයුම් අංශය විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛ 45 රෝහල් වෙත ලැබෙන අවස්ථාව වන විට එම ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් රෝගීන් වෙත නිකුත් කර තිබුණි

(ඇ) ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියා මර්දන ව්‍යාපෘතියට අදාළව ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් මත 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු අධිභාරයේ වටිනාකම රු.3,539,444 ක් විය.

(ඈ) රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර උපකරණ දේශීය හා විදේශීය තරඟකාරී සැපයුම්කරුවන් අතරින් අවම මිලට මිලදී ගැනීම සඳහා නිසි පරිදි පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැළසුමකට අනුව කටයුතු කර නොතිබීමේ හේතුවෙන්, දීර්ඝ කාලයක සිට වරින් වර දේශීය පෞද්ගලික සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමට සිදුවී තිබුණි. 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළදී වෛද්‍ය සැපයීම් අංශය විසින් එසේ දේශීයව මිලදී ගෙන තිබුණු ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර උපකරණ සඳහා වැයකර තිබුණු අතිරේක පිරිවැය රු.4,089,924,171 විය.

3.23 අනාර්ථික ගනුදෙනු

----------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණයවූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කුරුණෑගල රෝහලේ ආපන ශාලාව, එය පිහිටි භූමි ප්‍රමාණය හා සන්නිවේදන පියස ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් තොරව තෝරාගෙන තිබුණු ලියාපදිංචි සමූපකාර සමිතියකට මසකට රු.15,900 ක් බැගින් වසරකට රු.190,800 ක් වූ තක්සේරු මුදලකට කුලියට ලබාදී තිබුණි. එහෙත් අදාල සමූපාකාර සමිතිය විසින් එම වත්කම් වෙනත් පාර්ශවයන්ට මසකට රු.523,000 ක් බැගින් වසරකට රු.6,276,000 ආදායමක් ලැබෙන පරිදි කුලියට දී තිබුණි. මේ අනුව වාර්ෂිකව රෝහලට අහිමි වූ ආදායම දළ වශයෙන් රු.6,085,200 ක් පමණ වන බව නිරීක්ෂණය විය.

(ආ) මිල ගණනන් සන්සන්දනාත්මකව සැලකිල්ලට නොගැනීම හා නිසි සකසුරුවම් භාවයකින් කටයුතු නොකිරීම හේතුවෙන් බදුල්ල මහ රෝහලට අමු ආහාර ලබා ගැනීමේදී විෂයන් 15 ක් වෙනුවෙන් වර්ෂයකට රු.5,600,052 ක වැඩිපුර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ) බදුල්ල රෝහලේ පවිත්‍රතා කටයුතු සැපයුම්කරු සමග අත්සන් කර තිබුණු ගිවිසුම ප්‍රකාරව, පිරිසිදු කිරීමේ සේවයේ නිරත සේවකයෙක් දිනකට පැය 12 ක කාලයක් සේවය කිරීමෙන් අනතුරුව අතිකාල සඳහා හිමිකම් ලැබිය යුතු වුවත් එකී දෛනික ගිවිසුම් ගත සේවා කාලය සම්පූර්ණ නොකළ සේවකයින් 147 දෙනෙකු සඳහා දිනකට වැඩිපුර රු.8,747 ක් ගෙවා තිබීම හේතුවෙන් වාර්ෂිකව රු.3,192,757 ක අනාර්ථික වියදමක් රෝහල විසින් දරා තිබුණි.

3.24 විසඳා නොතිබුණු විගණන ඡේද

----------------------------------

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව.

| විගණකාධිපති වාර්තාවලට යොමුව | | යොමුගත විෂය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2007 | 6.6(a)xiii | ඖෂධ ප්‍රවාහනය කිරීමේදී සිදුවී ඇති රු.10,499,595 ක ඌනතාවය සැපයුම්කරුවන්ගෙන් අය කර ගැනීම |

3.25 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂය සඳහා ඉදිරිපත්කර තිබුණු විසර්ජන ගිණුමට අනුව, මූලධන වියදම් සඳහාවූ විදේශ ප්‍රදාන උපයෝජනය සියයට 35ක් හා විදේශ ණය උපයෝජනය සියයට 91ත් 97 ත් අතර පරාසයක විය. විදේශ ණය උපයෝජනයට සාපේක්ෂව විදේශ ප්‍රදාන උපයෝජනය දුර්වල තත්ත්වයක විය. විස්තර පහත දැක්වේ.

| මූල්‍යකරණය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| දේශීය අරමුදල් | 13,681,915,522 | 11,448,516,598 | 84% |
| විදේශීය ණය | 8,681,496,840 | 8,387,772,611 | 97% |
| විදේශ ප්‍රදාන | 2,282,375,000 | 805,794,198 | 35% |
| ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | 732,614,160 | 664,824,086 | 91% |
| විදේශ මූල්‍යයන ආශ්‍රිත දේශීය පිරිවැය | 783,598,448 | 318,709,048 | 41% |
| එකතුව | 26,162,000,000 | 21,627,616,541 | |

(ආ) විභාග පැවැත්වීමට, පිළිතුරු පත්‍ර ඇගයීමට හා විභාග පැත්වීමේ අනෙකුත් වියදම් වෙනුවෙන් රු.1,792,488 ක් වැයකරමින් 2013 මැයි 05 හා 2013 ජුලි 21 දිනවල අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු දුරකථන ක්‍රියාකරු හා උපස්ථායක / උපස්ථායිකා තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග ප්‍රතිඵල දුර්වල කළමනාකරණය හේතුවෙන් අවලංගු කිරීමට සිදුවී තිබුණි.

(ඇ) අධ්‍යාපන කටයුතු හා රැකියා සඳහා විදේශගතවී තිබුණු වෛද්‍යවරුන් 78 දෙනෙකු නියමිත දිනට සේවයට වාර්තා කර නොතිබුණු අතර ඒ අතරින් වෛද්‍යවරු 49 දෙනෙකුගෙන් ගිවිසුම් ප්‍රකාරව රජයට අයවිය යුතු රු.37,330,660 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද වැටුප් රහිතව විදේශගතවී තිබුණු වෛද්‍යවරු දෙදෙනෙකු වෙත වැටුප් ලෙස රු.1,099,583 ක් ගෙවා තිබුණි.

(ඇ) විශේෂඥ වෛද්‍ය පුහුණුව සඳහා වාර්ෂිකව ඉතා විශාල මුදලක් වැයකරන අතර 2013 හා 2014 වර්ෂවලදී පමණක් ඒ සඳහා වැයකර තිබුණු මුළු මුදල රු.4,587,102,523 ක් විය. නමුත් විශේෂඥ වෛද්‍ය පුහුණුව ලබන වෛද්‍යවරුන් ආපසු දිවයිනට නොපැමිණෙන ප්‍රවනතාවයක් පවතින බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශේෂඥ වෛද්‍ය පුහුණුව ලත් වෛද්‍යවරුන් 56 ක් දිවයිනට පැමිණ නොතිබුණි.

(ඉ) ජාතික රෝහල් වකුගඩු ඒකකයේ රුධිර කාන්දු පෙරණ උපකරණ සඳහා අවශ්‍ය අමතර උපාංගයක් වන dialyzer සපයා නොතිබීම හේතුවෙන් 2014 නොවැම්බර් මාසය තුළදී පමණක් අවස්ථා 104 කදී රෝගීන්ගේ පෞද්ගලික මුදලින් එම උපාංගය මිලදී ගෙන තිබුණි. තවද පාවිච්චියෙන් පසු එම උපාංගය පිරිසිදු කිරීමට යොදාගන්නා රසායනිකයක් වන Renal in Solution සපයා නොතිබීම හේතුවෙන් එම උපාංග නැවත භාවිතයට ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව නවතා තිබුණි.

(ඊ) නියැදි පදනම මත තෝරාගත් රෝහල් 06 කින් ලබා ගත් තොරතුරු අනුව, රෝහල් 03ක පවත්වාගෙන යනු ලබන ආපනශාලා වලින් අයකර ගත යුතුව තිබුණු රු.17,111,999ක් වූ කුලී ආදායම හා රු.508,186ක් වූ ජල හා විදුලි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. බදුල්ල මහ රෝහලේ ආපනශාලා දෙකක කොන්ත්‍රාත් ගිවිසුම්වල කාලය ඉකුත්වීමෙන් අනතුරුව වසර 2 කට වඩා වැඩි කාලයක් නව ගිවිසුමක් අත්සන් නොකර හා කුලී අයකර ගැනීමකින් තොරව පැරණි කොන්ත්‍රාත්කරු වෙතම ආපන ශාලා දෙක පවත්වාගෙන යාමට ඉඩදී තිබුණි.

(උ) 2013 වර්ෂයේදී ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් වැට් බදු සහිතව රු.12,402,493 ක් වැයකර Orthopedic OT Table 01ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඉතා වැදගත් තාක්ෂණික පිරිවිතර 09 ක් ඇගයීම් කර තිබුණු අතර සියළුම පිරිවිතර සම්පූර්ණ කර තිබුණු 07 වන අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගේ ලංසුව රු.10,660,714 ක් විය. නමුත් එක් පිරිවිතරයක් සම්පූර්ණ කර නොතිබුණු හා වැඩිම මිල වූ රු.11,073,655 ක් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුගෙන් මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදී තිබීම හේතුවෙන් රු.412,941 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. තවද සැපයීම සඳහා තෝරා ගත් ලංසුකරු හා අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු යන දෙදෙනාම සංතෘප්ත නොකරන ලද ඉතා වැදගත් තාක්ෂණික පිරිවිතරය සමාන වූ බැවින් මෙම උපකරණය අවම මිලට එනම් රු.1,960,000කට මිලදී ගැනීමේ හැකියාවක් තිබුණු බවද නිරීක්ෂණය විය.

(ඌ) අමාත්‍යාංශය සඳහා අනුමත තනතුරුවල පත්වීම් බලධාරියා අමාත්‍යාංශ ලේකම්වරයා වුවද, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධිකාරී බලය ඉක්මවමින් හා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් තොරව අවිධිමත් ලෙස කටයුතු කරමින්, 2008 අගෝස්තු 06 දින වන විට සෞඛ්‍ය රියදුරු ඕවර්සියර් තනතුරක් දරමින් සිටි සේවකයෙකු 2009 ජූනි 01 දින සිට ප්‍රවාහන වැඩ මූලික තනතුරහි වැඩබැලීම සඳහා පත්කර තිබුණු අතර, 2010 පෙබරවාරි 08 දින සිට ප්‍රවාහන වැඩ මූලික තනතුරේ පත්වීම ස්ථිර කර තිබුණි. තවද අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ප්‍රවාහන නිලධාරි තනතුරු 01ක් පමණක් තිබුණු අතර එහි ස්ථිර නිලධාරියෙකු සිටියදී ප්‍රවාහන නිලධාරි තනතුරු 02 ක් ඇති බවට සාවද්‍ය ලෙස වාර්තා කරමින් 2011 සැප්තැම්බර් 22 දින සිට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මොහු ප්‍රවාහන නිලධාරි තනතුරේ වැඩබැලීම සඳහා පත්කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී කොළඹ ළමා රෝහලේ වෛද්‍යවරයෙකු විදේශගත වීම සඳහා ලබා ගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු දින 37 ක් සඳහා වැටුප් ලෙස රු.91,057 ක් ගෙවා තිබුණි. විදේශගතවී සිටි සම්පූර්ණ කාලය තුළදී කොළඹ ළමා රෝහලේ වැඩ කළේය යන පදනමින් on call දීමනාව ලෙසරු.100,000 ක්ද ගෙවා තිබුණි. 2015 වර්ෂයේදීද මෙම වෛද්‍යවරයා වැටුප් රහිත නිවාඩු විධිමත් පරිදි අනුමත කර ගැනීමකින් තොරව විදේශගතවී තිබුණු අතර එම කාලය සඳහා වැටුප් ලෙස රු.76,710 ක් මෙම ගෙවා තිබුණි.

(ඒ) විධිමත් විනය පරීක්ෂණයකින් පසු වැරදිකරු බවට පත්වීම හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවයෙන් පහ කිරීම සඳහා අදාළ වෛද්‍යවරයා වෙත නිකුත් කර තිබුණු ලිපිය ඔහු වෙත භාරදී නොතිබුණි. සේවයෙන් පහ කිරීම ක්‍රියාත්මක විය යුතු දිනය වූ 2013 ජනවාරි 07 දිනට පසුව මාස 08 ක් සේවයේ යොදවා තිබුණු අතර එම කාලය තුළදී ඔහු වෙත රු.813,436 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 3.26 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13,972 | 12,202 | 1,770 | - |
| (ii) | තෘතියික මට්ටම | 31,023 | 25,504 | 5,519 | - |
| (iii) | ද්විතියික මට්ටම | 5,101 | 3,765 | 1,336 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 28,758 | 22,463 | 6,295 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 741 | - | 741 |
| | එකතුව | 78,854 | 64,675 | 14,920 | 741 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2014 දෙසැම්බර් 31 දිනට වූ පුරප්පාඩු 14,920 ක් පිරවීමටත්, අතිරික්තතා 741 ක් සඳහා විධිමත් අනුමැතිය ලබා ගැනීමටත් අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

ii. නියැදියක් ලෙස තෝරා ගත් අමාත්‍යාංශය, ඒ යටතේ ඇති ආයතන දෙකක සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්ධනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතිය තුළ පැවති විවිධ තනතුරු 14 ක් වර්ෂ 1 ත් 9 ත් අතර කාල පරාසයක සිට පුරප්පාඩුව පවතින අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර වැඩ බැලීමට හා රාජකාරි ආවරණය කිරීමට නිලධාරීන් පත්කර තිබුණි.

iii. 2014 සැප්තැම්බර් 04 දිනැති අංක 2-125/2014 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛයේ 03 ඡේදයට පටහැනිව සහ රාජ්‍ය සේවා කොමිසන් සභාවේ හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව, 2014 ඔක්තෝබර් 01 දින විශ්‍රාම ගොස් තිබුණු ශ්‍රී ලංකා ජාතික රෝහලේ ප්‍රධාන විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනිය 2015 පෙබරවාරි 25 දිනය වන විටත් එම තනතුරෙහි තබා තිබීම හේතුවෙන් එම තනතුර සඳහා සුදුසුකම් ලත් විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්ට අසාධාරණයක් සිදුකර තිබුණි.

iv. ළමා රෝහලේ නිර්වින්දන වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පැවතීම නිසා (MRI) Magnetic Resonance Imagine Scanner පරීක්ෂණ සංඛ්‍යාව සීමාවී තිබුණු අතර යන්ත්‍රය භාවිතයෙන් ලබාගත හැකි උපරිම සේවාව ලබාගැනීමට නොහැකිව තිබුණි. එසේම විකිරණ ශිල්පීන්ගේ සේවය අපේක්ෂා කරන ඒකක 12ක් පැවති අතර ඒ සඳහා අවම වශයෙන් විකිරණ ශිල්පීන් 38 දෙනෙකුගේ සහාය අවශ්‍ය බව හඳුනාගෙන තිබුණු නමුත් විකිරණ ශිල්පීන් 14 දෙනෙකුගේ සේවය පමණක් ලැබී තිබුණි. නිර්වින්දන වෛද්‍යවරුන්ගේ හා විකිරණ ශිල්පීන්ගේ හිඟය හේතුකොට ගෙන 2015 ජුනි 12 දින සිට 2015 දෙසැම්බර් 18 දින දක්වා කාලය තුළ MRI පරීක්ෂණ පොරොත්තු ලේඛනයේ රැඳී සිටි රෝගීන් ගණන 303 දෙනෙකු විය.